සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

## තෙවන වාර පරීක්ෂණය - 2020
## Third Term Test - 2020

**11 ශ්‍රේණිය** **Grade 11** | **නර්තනය - I** | **පැය එකයි** **One hour**

සැලකිය යුතුයි.

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතය.
- I කොටසෙහි බහුවර්ණ ප්‍රශ්න 40 ක් ද II කොටසෙහි ප්‍රශ්න 07 ක් ද වේ.
- I කොටසෙහි 1 - 30 දක්වා සියළුම ප්‍රශ්න සඳහා ද 30 - 40 දක්වා ඔබ උගත් සම්ප්‍රදායට අදාල ප්‍රශ්න කොටස තෝරා ගෙන පිළිතුරු සපයන්න.
- II කොටසෙහි පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 ක් සඳහා පිළිතුරු සපයන්න.

01. සරඹ අභ්‍යාස කිරීමේ දී සමගුණ, දෙගුණ, සිව් ගුණ යන්න පිළිවෙලින් වශයෙන් ද හඳුන්වනු ලැබේ.
(1) විලම්භ, මධ්‍ය, ද්‍රැත (2) ද්‍රැත, මධ්‍ය, විලම්භ
(3) විලම්භ, ද්‍රැත, මධ්‍ය (4) මධ්‍ය, විලම්භ, ද්‍රැත

02. සිංහල නැටුම් වන ගොයම් සහ කුළු නර්තන ද්‍රවිඩ ජන නැටුමේ දී හැඳින් වෙන්නේ.................... ................................................ යනුවෙනි.
(1) කෝලාට්ටම් සහ සුලකු (2) අරියවෙට්ටු සහ සුලකු
(3) අරියවෙට්ටු සහ සෙම්බු (4) පින්නල් කෝලට්ටම් සහ සුලකු

03. "සිද්ධ මුණිඳු වැඩ හිඳ බෝමුල විදුරාසන...." මෙම පද කොටස අයත් වන්නේ............................ .................................................. කවියකට ය.
(1) නමස්කාර (2) ග්‍රහපංති (3) කඩතුරා (4) මල් යහන්

04. "විශ්මය" නමැති ස්ථායි භාවයෙන් ජනිත වනුයේ.......................................................................... රසය යි.
(1) බීභත්ස (2) ශෘංගාර (3) ශාන්ත (4) අද්භූත

05. නර්තන ශිල්පියෙකුගේ අංග රචනය ........................................................................... අභිනයට අයත් වේ.
(1) සාත්වික (2) ආහාර්ය (3) ආංගික (4) වාචික

06. "හනික වරෙව් කොල්ලනේ..." ගීතය ඇතුළත් නාට්‍ය......................................මහතා විසින් නිර්මාණය කරන ලදී.
(1) දයානන්ද ගුණවර්ධන (2) එදිරිවීර සරත්චන්ද්‍ර
(3) බන්දුල ජයවර්ධන (4) ආර්. ආර්. සමරකෝන්

07. කොහොඹා කංකාරියේ දක්නට ලැබෙන අංගයක් වන ............................................ නාට්‍යමය ලක්ෂණ සහිත වේ.
(1) ගුරුගේ මාලාව (2) මී බන්ධනය (3) ඇත් බන්ධනය (4) අසුර යක්කම


08. "එදා හෙළදිව" කෘතිය රචනා කරන ලද්දේ........................................................................ නම් ඉංග්‍රීසි ජාතිකයා විසිනි.
(1) ස්පිල් බර්ජන් (2) ඉබන් බතුතා (3) ජෝන් කැලවේ (4) රොබට් නොක්ස්

09. ප්‍රස්තාරකරණයේ දී ඇඳෙන මාත්‍රා ............................................... යනුවෙන් හඳුන්වනු ලබයි.
(1) ලඝු මාත්‍රා (2) ගුරු මාත්‍රා (3) ප්ලුත මාත්‍රා (4) ද්‍රැත මාත්‍රා


10. කෝලම් නාටකයේ එන ...................................................................................... පූර්ව රංගයට අයත් අංගයකි.
(1) නාරිලතා කෝලම (2) සඳ කිඳුරු කෝලම (3) ජස කෝලම (4) සිංහ කෝලම

- ප්‍රශ්න අංක 11 සිට 13 දක්වා නිවැරදි පිළිතුර පහත වගුව ඇසුරින් තෝරන්න.

A තිරුව




B තිරුව




11. ආතත හා විතතානත කොටසට අයත් භාණ්ඩ දක්නට ලැබෙන්නේ,
(1) A තීරුවේ 1 හා 2 රූපවලය (2) A තීරුවේ 2 රූපය
(3) B තීරුවේ 4 හා 6 රූපවලය (4) B තීරුවේ 4 හා 5 රූපවලය

12. හින්දුස්ථානි සංගීතය සඳහා උපයෝගි කරගනු ලබන වාද්‍ය භාණ්ඩ දක්නට ලැබෙන්නේ,
(1) A තීරුවේ 1 රූපය (2) A තීරුවේ 2 රූපය (3) B තීරුවේ 5 රූපය (4) B තීරුවේ 6 රූපය
13. සුවිසි විවරණ වැනි ආගමික උත්සව අවස්ථාවන් හි නර්තනයේ දී යොදා ගනු ලබන රංග භාණ්ඩය ඇතුළත් රූපය වන්නේ,
(1) A තීරුව 2 රූපය (2) A තීරුවේ 3 රූපය (3) B තීරුව 5 රූපය (4) B තීරුව 6 රූපය
14. හඟුරන්කෙත කළුන්දෑව බදුල්ල ආදී ප්‍රදේශ වල ප්‍රචලිතව ඇති ගැමි නාටකය වන්නේ,
(1) නාඩගම් (2) කෝළම් (3) සොකරි (4) රූකඩ
15. ශ්‍රී ලංකාවේ මුද්‍රා නාට්‍ය කලාවේ ආරම්භයට මුල් වූ භාරතීය පඬිවරයෙකු වන්නේ,
(1) රවීන්ද්‍රනාත්තාගෝර් ය. (2) ශාන්ති දේව ඝෝෂ් ය.
(3) උදය ශංකර්ය (4) ශ්‍රීමති මේනකාය
16. පුරුෂ පක්ෂයට වඩාත් උචිත වූ ජන නර්තන අඩංගු පිළිතුර තෝරන්න.
(1) කළගෙඩි, ගොයම් (2) ලී කෙළි, පන් (3) පතුරු, කළගෙඩි (4) කඩු, ලී කෙළි
17. පහතරට, සබරගමු හා උඩරට ශාන්ති කර්ම වල දක්නට ලැබෙන ප්‍රධානතම සැරසිලි පිළිවෙලින් දැක්වෙන පිළිතුර වනුයේ,
(1) තටුව, මැස්ස හා වෙස් අත්ත ය. (2) වීදිය, තොරණ හා යහන ය.
(3) වීදිය, මැස්ස හා වෙස් අත්ත ය. (4) තටුව, ඊගස හා මල් යහන ය.
18. අංජලිකා චිත්‍රසේන මහත්මිය විසින් රංග රචනය කරන ලද මුද්‍රා නාට්‍ය,
(1) කරදිය යි. (2) නල දමයන්ති යි. (3) කුඹී කතාව යි. (4) සත්පත්තිනි යි.
19. "රිටි පන්න" භාවිතා කරනු ලබන කර්මාන්තයය ආශ්‍රිත නර්තන නිර්මාණය වන්නේ,
(1) ධීවර කර්මාන්ත යේ දී ය. (2) මැටි කර්මාන්තයේ දී ය.
(3) තේ දළු කර්මාන්තයේ දී ය. (4) පතල් කර්මනා්තයේ දී ය.
20. බෙරයෙහි උපදවනු ලබන ප්‍රධාන අක්ෂර වනුයේ,
(1) ගර්භාක්ෂර යි (2) තාලාක්ෂර යි (3) ලඝු අක්ෂර යි (4) සතර. බීජාක්ෂර

- **ප්‍රශ්න අංක 21 සිට 23 දක්වා පහත සඳහන් වගුවෙන් පිළිතුරු තෝරන්න.**

| තීරු | A | B | C |
|---|---|---|---|
| 1 | මූලික ආලේපන | අයිබ්‍රෝ පෙන්සිල් | අවකාශ භාවිතය |
| 2 | කෝඩ් නූල් | රබර් පෝම් ෂීට් | කෙම්පික්ස් |
| 3 | දිසා හා තල | චලන භාවිතය | නිර්මාණ කරණය |
| 4 | භාව ප්‍රකාශන | ලිප්ස්ටික් | ඇඳුම් පැළඳුම් |

21. දේශීය නර්තන සම්ප්‍රදායන්ගේ රංග වස්ත්‍රාභරණ සැකසීම සඳහා භාවිතා කරන අමුද්‍රව්‍ය අඩංගු වනුයේ,
(1) 1 තීරුවේ A, B හා C හි ය. (2) 2 තීරුවේ A, B හා C හි ය.
(3) 3 තීරුවේ A, B හා C හි ය. (4) 4 තීරුවේ A, B හා C හි ය.
22. සරල අංග රචනයක දී භාවිතා කරන මූලික අමුද්‍රව්‍ය අඩංගු වනුයේ,
(1) 1 තීරුවේ A, B සහ 3 තීරුව B ය. (2) 1 තීරුවේ B, C සහ 3 තීරුව B ය.
(3) 1 තීරුවේ A, B සහ 4 තීරුව B ය. (4) 1 තීරුවේ A, C සහ 4 තීරුව B ය.
23. සාර්ථක රංග රචනයක දී ඉතා වැදගත් වන කරුණු අඩංගු වන නිවැරදි පිළිතුර තෝරන්න.
(1) 1 තීරුව C සහ 3 තීරුව A, B ය. (2) 1 තීරුවේ C සහ 4 තීරුව A, B ය.
(3) 1 තීරුවේ C සහ 2 තීරුව A, B ය. (4) 1 තීරුවේ A, B සහ 3 තීරුව B ය.
24. ඝන වාද්‍ය භාණ්ඩ පමණක් අයත් පිළිතුර තෝරන්න.
(1) තාලම්පට, අත්මිණිය, බුම්මැඩිය වේ. (2) අත්මිණිය, හක්ගෙඩිය, තාලම්පට වේ.
(3) රබු, හක්ගෙඩිය, අත්මිණිය වේ. (4) තාලම්පට, අත්මිණිය, තලිය වේ.
25. පත්තිනි අනුරූපණය හා තෙල්මෙ නර්තනය දක්නට ලැබෙන ශාන්ති කර්මය කුමක් ද?
(1) කොහොඹා කංකාරිය (2) දෙවොල් මඩුව
(3) වලියක් මංගල්‍ය ය (4) බලි ශාන්ති කර්මය
26. "කච්ච කෙට්ට" නම් අභ්‍යාස පුහුණු ව ලබා දෙන නර්තන සම්ප්‍රදාය වනුයේ,
(1) භරත (2) මනිපුරි (3) කතකලි (4) කතක්
27. රාධා ක්‍රිෂ්ණා ප්‍රේම වෘත්තාන්තය තේමා කර ගනිමින් නිර්මාණය වී ඇති මනිපූරි නර්තනාංගයකි.
(1) පුංග් චෝලම් (2) සංකීර්තන් (3) පරෙංග් (4) රාස් ලීලා
28. කතකලි නර්තන සම්ප්‍රදාය උගන්වනු ලබන ප්‍රධාන ආයතනය වනුයේ,
(1) කේරල කලා මණ්ඩලම් (2) විශ්ව භාරතීය විශ්ව විද්‍යාලය
(3) ශාන්ති නිකේතනය (4) භාත්කණ්ඩ විශ්ව විද්‍යාලය

29. උඩරට, පහතරට, සබරගමු වන්නම් නර්තනයේ දී යොදා ගනු ලබන චලන වර්ග වනුයේ,
(1) රිද්මයානුකූල (2) තාලානුකූල (3) සංචාරි (4) ප්‍රකාශනාත්මක

30. නමස්කාර, සන්න යන ගායනා අයත් වන්නේ,
(1) ප්‍රශස්ති ගායනාවලට ය (2) කෝලම් ගායනාවලට ය
(3) ශාන්තිකර්ම හා බැඳි ගායනාවලට ය (4) වන්නම් හා බැඳි ගායනාවලට ය

**<u>II කොටස - උඩරට නර්තනය</u>**

31. උඩරට නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ ලෙස සැලකෙන්නේ,
(1) මහනුවර, කුරුණෑගල, තංගල්ල (2) දෙවි නුවර, කුරුණෑගල, ගාල්ල
(3) දෙවි නුවර, උඩු නුවර, ගාල්ල (4) මහනුවර, කුරුණෑගල, සත් කෝරළය

32. සිංහරාජ වන්නමට අයත් බෙර පදය වන්නේ,
(1) දොදොම්ත තකු දොම් (2) දොං ජිංත ගත දොංත
(3) දොං දොං ජිං ජිං ගජිගත (4) ජිං ගත ගොගො

33. කොහොඹා කංකාරියේ පුද ලබන ප්‍රධාන වන්නේ,
(1) දෙවොල් දෙවියන් හා බණ්ඩාර දෙවියන් (2) කොහොඹා දෙවියන් හා බණ්ඩාර දෙවියන්
(3) පත්තිනි හා දෙවොල් දෙවියන් ය. (4) වීර මුණ්ඩ හා මංගර දෙවියන් ය.

34. ගැට බෙරයෙන් වාදනයට අදාල වන පද කොටස වන්නේ,
(1) ජෙං ජෙං ගත් කිට ජෙං ගත් (2) ගුංද ගති ගත ගත්ත ගති ගත
(3) දෝං ජිං ජිං තකට දොං තක (4) කිත්තක් කිත්තක් ජෙං ජෙං තා

35. "තත් තකට තක රොං................." මෙය
(1) කස්තිරමකි (2) සීරුමාරුවකි (3) කලාසමකි (4) අඩව්වකි

36. "කොහොඹා කංකාරිය හා සමාජය" යන කෘතිය රචනා කරන ලද්දේ,
(1) මහාචාර්ය මුදියන්සේ දිසානායක මහතා (2) මහාචාර්ය තිස්ස කාරියවසම් මහතා
(3) මහාචාර්ය ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය (4) මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ මහතා

37. සිබා බන්ධනය, නෙත්ති මාල හා පාහිම්පත අයත් වන්නේ,
(1) නෛඅඩි ඇඳුම් කට්ටලයට (2) වෙස් ඇඳුම් කට්ටලයට
(3) උඩැක්කි ඇඳුම් කට්ටලයට (4) පන්තේරු ඇඳුම් කට්ටලයට

38. ගැට බෙරයේ කොටස් දෙකක් වන්නේ,
(1) වලයම හා සුරත් කට්ටුව (2) කැපුම්හම හා ගැටිය
(3) සුරත් තට්ටුව හා ඉල්ලම් (4) වෙනිවර හා සුරත්තට්ටුව

39. කොහොඹා කංකාරිය ශාන්ති කර්මයට අයත් නාට්‍යමය අවස්ථා දෙකකි,
(1) ගබඩා කොල්ලය හා අඹ විදමන (2) යක්කම් පහ සහ රාමා මැරීම
(3) ගබඩා කොල්ලය හා යක්කම් පහ (4) ගුරුගේ මාලාව හා අඹ විදමන

40. ".... වන පැත්ත බිය පත්ව සයනම්...." මෙහි දෙවෙනි කවි පදය වනුයේ,
(1) දුරත් යනෙන විටත් දුවන (2) නොනැවත යනු නැත එතනින්
(3) හිරුත් අවර ගිරත් පැමිණ (4) ගමනක් යන විලසක් දුන

**<u>III කොටස - පහතරට නර්තනය</u>**

31. පහතරට නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ ලෙස සැලකෙන්නේ,
(1) මාතර, බෙන්තර, නයිගල (2) කලුතර, බෙන්තර, රත්නපුර
(3) මාතර, ගම්පහ, කෑගල්ල (4) මාතර, බෙන්තර, රයිගම

32. අනුරාග දණ්ඩ නාලය සින්දු වන්නමට අයත් බෙර පදය වන්නේ,
(1) තක දිත් තක දොං දොම් දිත් තක දොම් (2) දොං තම් ගත ගදිතම් ගත ගුගුදම් ගත ගදිතා
(3) ගුද ගදි ගත ගුද ගුද ගති ගත (4) දිත්තම් දිතකු දොම් දොම් තා

33. දෙවොල් මඩුවේ පුද ලබන ප්‍රධාන දෙවිවරු වන්නේ,
(1) දෙවොල් දෙවි හා සමන් දෙවි (2) පත්තිනි දෙවි හා දෙවොල් දෙවි
(3) දෙවොල් දෙවි හා වීර මුණ්ඩ දෙවි (4) මංගර දෙවි හා වාහල දෙවි

34. පහතරට බෙර වාදනයට අදාල පද කොටස වන්නේ,
(1) කුංත ගජිගත ගත්ත කුජි ගත (2) ජෙං ජෙං ගත් තකු ජෙගත්
(3) ගුද ගති ගත ගුද ගුද ගතිගත (4) කිත්තක් කිත්තං ජෙං ජෙං තා

35. ගුහිති ගදිරිකිට ගුද ගුද ගුංදිත්තා ගහිති ගදිරිකිට ගත ගත ගද්දික් තා............ යනු
(1) දොළොස්වන (12) ඉලංගම් සරඹ ය යි (2) නමවන (09) ඉලංගම් සරඹය යි
(3) අටවන (08) ඉලංගම් සරඹ ය යි (4) දහවන (10) ඉලංගම් සරඹය යි
36. පහතරට ශාන්ති කර්ම කෘතිය රචනා කරන ලද්දේ,
(1) මහාචාර්‍ය ජයසේන කෝට්ටගොඩ මහතා (2) මහාචාර්‍ය තිස්ස කාරියවසම් මහතා
(3) මහාචාර්‍ය ලයනල් බෙතෙර ගේ මහතා (4) මාහාචාර්‍ය කලුආරච්චි මහතා
37. පහතරට දෙවොල් ඇඳුම් කට්ටලයට අයත් රංග වස්ත්‍රාභරණ වනුයේ,
(1) හැට්ටය රැළි සාය වෙස් මුහුණු (2) හැට්ටය, රැළි සාය, කාගුල් කුට්ටම
(3) හේලය, පච්ච වඩම, හස්තකඩය (4) හැට්ටය, සේලය, වෙස් මුහුණ
38. පහතරට බෙරයේ කොටස් දෙකක් වන්නේ,
(1) වෙනිවර හා සුරත්තට්ටුව (2) හයිතට්ටුව හා සුරත්තට්ටුව
(3) කැපුම්හම හා බෙර පුහුල (4) හයිතට්ටුව හා වෙනිවරය
39. දෙවොල් මඩු ශාන්ති කර්මයට අයත් නාට්‍යමය පෙළපාලි වනුයේ,
(1) දෙවොල් ගොඩ බැසීම හා අසුර යක්කම (2) අඹ විදමන හා ඌරා යක්කම
(3) දෙවොල් ගොඩ බැසීම හා අඹ විදමන (4) දෙවොල් ගොඩ බැසීම හා ගබඩා කොල්ලය
40. ශුද්ධ තාලය සින්දු වන්නමේ දෙවෙනි කවි පදය ආරම්භ වන්නේ,
(1) සිරිලක පවර දෙව් නුවරෙහි ......... යනුවෙනි (2) සිරි පිරි ගිරි මුදනත සුර පුර.... යනුවෙනි
(3) සිරි සඳ සඟ සිරි සඳ සමගි වන ..... යනුවෙනි (4) සුරිඳුනි අසන් ම කියන බස එබැති පෙමිණ යනුවෙනි

## IV කොටස - සබරගමු නර්තනය

31. සබරගමු නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ ලෙස සැලකෙන්නේ,
(1) රත්නපුර, බලංගොඩ, මල්වාන (2) බලංගොඩ, අම්බලන්ගොඩ, මල්වාන
(3) බලංගොඩ, අම්බලන්ගොඩ, කලවාන (4) රත්නපුර, බලංගොඩ, කලවාන
32. විරාඩි වන්නමට අයත් බෙර පදය වන්නේ,
(1) ජිමිත කුදා දොම් (2) කුදත් තත්කිට තකට ජෙංතක
(3) ජිං කිටිතත් තත් කිටිතක (4) දොංත තකට
33. පහන්මඩුවේ පුද ලබන ප්‍රධාන දෙවිවරු වන්නේ,
(1) දෙවොල් හා වීර මුණ්ඩ දෙවියන් ය. (2) පත්තිනි හා දෙවොල් දෙවියන් ය.
(3) පත්තිනි හා වාහල දෙවියන් ය. (4) දෙවොල් හා කොහොඹ දෙවියන් ය.
34. දවුල් වාදනයට අදාල වන පද කොටස් වන්නේ,
(1) දිත්තම් දිතකු දොම් දොම් තා (2) කුංත ගත ගත ගත්ත කුද කුද
(3) කුදත් තත් කිට තකට ජෙමිතකු (4) දෝං ජිං ජිං තකට දොං තක
35. කුදිත ගත ගත ගතිත කුද කුද /// කුදිත තත් කුද ගතික ගත දොං ... මෙය,
(1) අඩව්වකි (2) කස්තිරමකි (3) ඉරට්ටියකි (4) කලාසමකි
36. සමන් දේවාල පුද සිරිත් කෘතිය රචනා කරන ලද්දේ
(1) මහාචාර්ය ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය (2) මහාචාර්ය තිස්සකාරිය වසම් මහතා
(3) මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ මහතා (4) මහාචාර්ය මුදියන්සේ දිසානායක මහතා
37. රතු හැට්ටය, කාගුල් හා අත්පොට හතර අයත් වන්නේ,
(1) අඹ විදමන ඇඳුම් කට්ටලයට යි (2) දොවොල් ඇඳුම් කට්ටලයට යි
(3) පත්තිනි ඇඳුම් කට්ටලයට යි (4) තෙල්මෙ ඇඳුම් කට්ටලයට යි
38. දවුලේ කොටස් දෙකක් වන්නේ,
(1) මන්ඩලම හා තට්ටුව (2) ගැටිය හා සුරත්තට්ටුව
(3) ගැටිය හා කයිපුඩි වලල්ල (4) ගැටිය හා තට්ටුව
39. පහන් මඩු ශාන්ති කර්මයට අයත් නාට්‍යමය අවස්ථා දෙකකි
(1) අසුර යක්කම, ගබඩා කොල්ලය (2) ගුරුගේ මාලාව , දාන පහ
(3) අඹ විදමන, දෙවොල් ගොඩ බැසීම (4) යක්කම්, ගුරුගේ මාලාව
40. "සත්තෙන් රජුන් පොරණ ගත්තෙන් රැගුම් කරන"
(1) ඇත්තෙන් කිවින් පිරිවරා යන්නයි (2) කියත් කවි දන එතැන වාඩි යන්නයි
(3) එක් තැන් වෙමින් විඳ දරා යන්නයි (4) එතැන සිටි පැවති රඟ නාඩි යන්නයි

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපා
Department of Education, Southern Province Department of Education, Southern Province Department of Educ

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Department of Education, Southern Province**

**තෙවන වාර පරීක්ෂණය - 2020**
**Third Term Test - 2020**

| | | |
|---|---|---|
| **11 ශ්‍රේණිය**<br>**Grade 11** | **නර්තනය - II** | **පැය දෙකයි**<br>**Two hours** |

සැලකිය යුතුයි.

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4ක් ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.**

(01) සියළුම ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.

(i) ලී කැටයමින් කළ නළඟනකගේ රූපයක් දැකිය හැක්කේ ........................................ දේවාලයේ දී ය.

(ii) බෞද්ධ ආගමික සිද්ධස්ථාන වල සිදු කෙරෙන දවුල්, තම්මැට්ටම්, හොරණෑ වාදනය ........................ ............................. නමින් හැඳින් වේ.

(iii) කරදිය මුදා නාට්‍යයේ මණ්ණඩි රාළ සහ මකුළුවාගේ චරිත රංගනය කරන ලද්දේ............................. .................... මහතා විසිනි.

(iv) කෝලම් නාටකයේ ප්‍රධාන ලක්‍ෂණයක් වනුයේ එක් එක් චරිත සඳහා ................................ පැළඳීමයි.

(v) සෞන්දර්ය අධ්‍යයන ආයතනය සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය බවට පත් වන්නේ......................... ............................... වර්ෂයේ දී ය.

(vi) භරත මුණිගේ නාට්‍ය ශාස්ත්‍රයට අනුව.............................................. හා නාට්‍ය ධර්මී යනුවෙන් නාට්‍ය ශෛලීන් දෙකක් නම් කර ඇත.

(vii) ප්‍රථමයෙන් උඩරට වන්නම් ගායනා කරන ලද්දේ ........................................................... මඩුවේ දී ය.

(viii) රේඛා, හැඩතල, සමබරතාව යන මූල ධර්ම චිත්‍ර කලාවට මෙන්ම..................................................... කලාවට ද වැදගත් වේ.

(ix) සබරගමු නර්තන සම්ප්‍රදායේ කලාසම යන්නට සමානව උඩරට හා පහතරට නර්තන කොටස නම් කරන්න.

(අ) උඩරට- .........................................   (ආ) පහතරට - ..........................................

(x) "විල්සන් ඔලබොඩුව" මහතා "අරනෝලිස් ඉඹුල්ගොඩ යන ශිල්පීන් වඩාත් ප්‍රසිද්ධියට පත් වූ නර්තන සම්ප්‍රදායන් නම් කරන්න.

(ඇ) විල්සන් ඔලබොඩුව - ..........................   (ඉ) අරනෝලිස් ඉඹුල්ගොඩ - ...............................

(ලකුණු 1 × 12 = 12)

02 (i) මාත්‍රා (2 + 3) සුළු මැදුම් තාල රූපයට අනුව වන්නමක / සින්දු වන්නමක බෙර පදයක් ප්‍රස්තාර කරන්න.

(ii) "සිත් ලෙස ලොව සැදි චක්‍ර වළල්ලා - නෙත් දස සුරිඳුගේ නුවර සියල්ලම" මෙම කවි පාද ප්‍රස්තාර කරන්න.

(iii) සැව්ලා වන්නම / නාතිලිංචි තාලය / මණ්ඩූක වන්නමට - සින්දු වන්නම අදාල අඩව්වක් / ඉරට්ටියක් ප්‍රස්තාර කරන්න.

03 පහත සඳහන් වගුවෙන් (i), (ii), (iii) යන කොටස් වලින් එක් කොටසකින් එකක් බැගින් තෝරා ගෙන මාතෘකා 3 සඳහා කෙටි සටහන් ලියන්න.

| (i) | (ii) | (iii) |
|---|---|---|
| මුද්‍රා නාට්‍ය | ප්‍රශස්ති | එස් පනිභාරත මහතා |
| ශෛලිගත නාට්‍ය | වන්නම් වල පොදු ලක්ෂණ | සවුරිස් සිල්වා මහතා |
| ගීත නාට්‍ය | ටීකා සීපද කවි | වජිරා චිත්‍රසේන මහත්මිය |
| තාත්වික නාට්‍ය | මල් යහන් කවි | අචාර්ය මිරැන්ඩා හේමලතා මහත්මිය |

04 දේශීය නර්තන කලාවේ අනන්‍යතා ලක්ෂණ ශාන්ති කර්ම තුළින් පිළිබිඹු වේ.

(i) සබරගමු පහන් මඩුවේ සිදු කරන චාරිත්‍ර විධි හතරක් නම් කරන්න.

(ii) කොහොඹා කංකාරියේ භාවිත රංග වස්ත්‍ර පිළිබඳ විමසීමක් කරන්න.

(iii) දෙවොල් මඩු ශාන්ති කර්මයේ පුරාවෘත්ත කතාව මගින් සමාජයට ලබා දෙන උපදේශය පිළිබඳ විග්‍රහයක් කරන්න.

05 දේශීය ජන නැටුම් හා ජන නාටක තුළින් වීම සමාජය විවරණය වේ.

(i) සොකරි නාටකයට අයත් කවියක් ලියා දක්වන්න.

(ii) කෝලම් නාටකයේ චරිත දෙකක් නම් කර ඉන් එක් චරිතයක් තුළින් සමාජය විවරණය වූ විග්‍රහයක් කරන්න.

(iii) ගැමි සංස්කෘතියේ සමාජ සාරධර්ම හා විශ්වාස ගොඩ නැගී ඇති ආකාරය පිළිබඳ ජන නැටුම් වලට අදාල කවි 2 ක් මගින් විස්තර කරන්න.

06 පහත රූපරාමු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

A



B



C



D



(i) A හා B රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදායන් දෙක ලියන්න.

(ii) C රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදායේ සරාගා දෙකක් නම් කර එම නර්තනය ප්‍රවර්ධනය සඳහා දාය වූ ශිල්පියෙක් පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(iii) D නර්තන සම්ප්‍රදායේ සංගීත සම්ප්‍රදාය නම් කර ප්‍රධාන වාද්‍ය භාණ්ඩය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

07 (i) නර්තන කලාව හැදෑරීමෙන් සහජීවනය සහ නායකත්ව ගුණාංග වර්ධනය වේ. මේ පිළිබඳ ඔබගේ අදහස් දක්වන්න.

(ii) ගීත අනුව නර්තන නිර්මාණ කිරීමේ දී රසවින්දනය වර්ධනය වන ආකාරය පිළිබඳ ලියා දක්වන්න.

(iii) දේශීය නර්තන කලාවේ දියුණුව සඳහා රූපවාහිනිය යොදා ගත හැකි ආකාරය පිළිබඳ ඔබේ යෝජනා ඉදිරිපත් කරන්න.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 1 ) | 02. ( 2 ) | 03. ( 3 ) | 04. ( 4 ) | 05. ( 2 ) | 06. ( 3 ) | 07. ( 1 ) | 08. ( 4 ) | 09. ( 2 ) | 10. ( 3 ) |
| 11. ( 1 ) | 12. ( 3 ) | 13. ( 2 ) | 14. ( 3 ) | 15. ( 1 ) | 16. ( 4 ) | 17. ( 2 ) | 18. ( 3 ) | 19. ( 1 ) | 20. ( 4 ) |
| 21. ( 2 ) | 22. ( 3 ) | 23. (1) | 24. (4) | 25. (2) | 26. (3) | 27. (4) | 28. ( 1 ) | 29. (2) | 30. (3) |
| 31. (4) | 32. (1) | 33. (2) | 34. (3) | 35. (4) | 36. (1) | 37. (2) | 38. (4) | 39. (3) | 40. (1) |

## පිළිතුරු පත්‍රය – II පත්‍රය

(ල. 1x40=40)

(01) (i) ඇම්බැක්කේ (ii) හේවිසි

(iii) චිත්‍රසේන ඩයස් මහතා (iv) වෙස් මුහුණු

(v) 2005 (vi) ලෝක ධර්මී

(vii) කවිකාර (viii) නර්තන

(ix) (අ) කස්තිරම (x) (අ) පහතරට

(ආ) ඉරට්ටිය (ආ) උඩරට

(i) සිට (viii) දක්වා පිළිතුරකට ලකුණු 01 බැගින් - ලකුණු 08

(ix) සිට (x) දක්වා පිළිතුරකට ලකුණු 02 බැගින් - ලකුණු 04

මුළු ලකුණු (8 + 4 ) = 12

(1 - 8 දක්වා ලකුණු 08 , 9 - 10 දක්වා ලකුණු 2 x 2 , සම්පූර්ණ ලකුණු 12 )

(02) (i) උඩරට තුරඟා වන්නම :- බෙරපදය :- දොං ජිංත ගත දොංත

| ^ | | / | | | ^ | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 3 |
| දොං | - | ජිං | - | ත | ග | ත | දොං | - | ත |

පහතරට භාවාදි කාලය :- දිං ගතිග තම් දොංත

| ^ | | / | | | ^ | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 3 |
| දිං | - | ග | ති | ග | තම් | - | දොං | - | ත |

සබරගමු : කුදිරඩි වන්නම : ජිං ජිමිත තත් තකට

| ^ | | / | | | ^ | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 3 |
| ජිං | - | ජි | මි | ත | තත් | - | ත | ක | ට |

විභාග කර දැක්වීම හා සංකේත සඳහා ල. 02

බෙරපදය ප්‍රස්ථාර කිරීම ල. 02 (මුළු ලකුණු 04 යි.)

| / | | | | / | | | | / | | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| + | සිත් | ලෙ | ස | ලො | ව | සැ | දි | චක් | - | ර | ව | ලල් | - | ලා | - |
| + | + | චක් | - | ර | - | ව | - | ලල් | - | - | - | ලා | - | - | - |

විභාග කර දැක්වීම හා සංකේත ල. 02

කවිපද ප්‍රස්ථාර කිරීම ල. 02 (මුළු ලකුණු 04

(ii) උඩරට අඩව්ව (සැවුලා වන්නම)

| ∧ 1 | 2 | / 1 | 2 | 3 | 4 | ∧ 1 | 2 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජෝං | - | තත් | - | තත් | - | ජෙ | - | තත් | - | තත් | - |
| ජෝං | - | තත් | - | තත් | - | ජිං | - | තා | - | - | - |
| ජෙ | නු | තත් | - | තත් | - | ජෙ | නු | තත් | - | තත් | - |
| ජෙ | නු | තත් | - | තත් | - | ජෙ | නු | තා | - | - | - |
| ජෝං | - | තත් | - | තත් | - | ජෝං | - | තා | - | - | - |
| ජෙ | නු | තත් | - | තත් | - | ජෙ | නු | තා | - | - | - |
| ජෝං | - | තා | - | - | - | ජෙ | නු | තා | - | - | - |
| දොහො | කඩ | තා | - | - | - | දොහ | කඩ | ග | ත | කු | ද |
| දොහො | කඩ | තා | | | | | | | | | |

පහතරට ඉරට්ටිය (තාතිලිංචි තාලය සිංදු වන්නම)

| ∧ 1 | 2 | / 1 | 2 | 3 | 4 | ∧ 1 | 2 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දොම් | - | තත් | - | දිම් | - | ග | ත | ගු | ගු | දි | ත |
| ග | ත | ගුහි | තිග | දිරි | කිට | දොම් | - | ග | ත | ග | ත |
| ගුම් | - | දා | | | | | | | | | |

සබරගමු අඩව්ව (මණ්ඩුක වන්නම)

| ∧ 1 | 2 | 3 | / 1 | 2 | 3 | 4 | ∧ 1 | 2 | 4 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජිං | - | ත | ගත් | - | තත් | - | ග | ති | ත | ග | ත | දොං | - |
| ජිං | - | ත | ග | ත | ග | ත | ග | ති | ත | ග | ත | දොං | - |
| ජිං | - | ත | ගත් | - | තත් | - | ග | තත් | - | කු | ද | ග | ත |
| තා | - | - | ගත් | - | තත් | - | ග | තත් | - | ක | ද | ග | ත |
| තා | - | | | | | | | | | | | | |

* විභාග කර දැක්වීම හා සංකේත සඳහා ල. 02
අඩව්ව / ඉරට්ටය ප්‍රස්ථාර කිරීමට
මුළු ලකුණු 04

(03) (i) එක් එක් මතෘකාව පිළිබඳව නිවැරදිව කරුණු 04 බැගින් ලියා ඇත්නම් එක් කරුණකට 1 බැගින් ලකුණු 04 යි.
(4 x 3 = 12)

04 (i) සබරගමු පහන් මඩුවේ සිදු කෙරෙන කප් සිටුවීම, පහන් දැල්වීම, පළඹ වැනි වීම මඩු පේ කිරීම දේවාරාධනාව ගිනි පෑගීම ආදි චාරිත්‍ර හතරක් නම් කර ඇත්නම් ලකුණු 04 යි.

(ii) රංගවස්ත්‍රාභරණ නම් කර විස්තර කිරීමට ලකුණු 04 යි.
(විස්තර කිරීමේ දී යොදා ගන්නා අමුද්‍රව්‍ය අඳින පළඳින ලබන ශරීරයේ ස්ථාන දැක්වීම ප්‍රමාණවත් වේ.)

(iii)
- වෛරය පළිගැනීම වැනි සමාජ අකටයුතු කම් සඳහා දඬුවම් හිමි වන බව
- තමාගේ සැපත වෙනුවෙන් අන් අයට හිංසා පැමිණවීම දඬුවම් විඳිය හැකි වරදක් බව
- වෛරයෙන් වෛරය නොසන්සිඳෙන බව බුදුදහමේ ද සඳහන් වන බව

ආදී කරුණු 02 ක් විස්තර කර තිබේ නම් ලකුණු 04 යි.
මුළු ලකුණු 04 × 3 = 12

05 (i) සොකරි නාටකයේ අයත් කවියක් ලියා ඇත්නම් (ලකුණු 02)

(ii) කෝළම් නාටකයේ චරිත
ජසයා, ලෙංචිනා, නොංචි, අණබෙර, මුදලි, හේවා පොලිස්...... ආදී චරිත දෙකක් නම් කර තිබේ නම් (ලකුණු 02)
- තෝරාගත් චරිතයෙන් සමාජය විග්‍රහ වන ආකාරය, සටහන් වී තිබේ නම්. (ලකුණු 04 යි.)

(iii) ගැමි නැටුම් හා බැඳී ගායන තුළින් ගැමි ජනතාවගේ ජීවන රටාව විද්‍යාමාන වන බව
- ⋆ ගැමි ඇදහිලි හා විශ්වාස
- ⋆ සමාජ සහජීවනය

උදා:-
- ලොව සෙත් කරවන පතිනි සදින්නේ.....
- ඉර දෙවියන්ගේ ඉර ගල ගාවා...........
- උදේ සිටන් වකුටු කොන්ද.............
- ගාන තෙල් සඳුන් වරලස............
- උදයට පායන හිරු දෙවියන්ටයි............

මෙම කවි උදා: සහිතව ලියා ඇත්නම් (ලකුණු 04)

06 (i) A හා B රූපයෙන් නර්තන සම්ප්‍රදායන් 2 ක් නම් කිරීමට (ලකුණු 02)

(ii) C රූපයට අදාල සම්ප්‍රදායේ සරානා 2 නම් කිරීමට (ලකුණු 01)
ශිල්පියකු පිළිබඳ හැඳින්වීමට (ලකුණු 03)

(iii) D රූපයට අදාල සම්ප්‍රදායේ සංගීත සම්ප්‍රදාය නම් කිරීමට (ලකුණු 02)
ප්‍රධාන වාද්‍ය භාණ්ඩ හැඳින්වීමට (ලකුණු 04)

07 (i)
- සංස්කෘතික හර පද්ධතින් ආරක්ෂා කිරීමක් සිදුවන බව
- ආගන්තුක සත්කාරය, බත බුලතින් සංග්‍රහ කිරීම, ශිල්පීන් අතර ආචාර සමාචාර කිරීම
- කණ්ඩායම් ක්‍රියාකාරකම්, නායකත්වයට ගරු කිරීම, බිම වාඩි වී ශිල්ප හැදෑරීම
- සෞන්දර්යාත්මක සිතුවිලි තුළින් යහපත් සමාජයක් බිහිවීමට මඟ සැලසෙන බව (ලකුණු 04)

(ii)
- ගීතයේ අදහසට අනුව උචිත නර්තන චලන නිර්මාණය කළ යුතු බව
- ගීතයට අනුකූලව රංග වස්ත්‍රාභරණ යොදා ගත යුතු බව,
- රංග උපකරණ සුදුසු පරිදි යොදා ගැනීම (ලකුණු 04)


(iii)
- දේශීය ශාන්ති කර්ම ප්‍රචාරය කිරීම හා සංරක්ෂණය කළ හැකි බව.
- දේශීය නර්තන අංග ඇතුළත් වැඩ සටහන් ප්‍රචාරය කළ හැකි බව.
- අධ්‍යාපනික වැඩ සටහන් සකස් කළ හැකි බව.
- විද්වතුන් සම්බන්ධ කර වැඩ සටහන් ක්‍රියාත්මක කළ හැකි බව. (ලකුණු 04)


අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට


**www.lol.lk**
Learn Ordinary Level


LOL.lk online Book Store


අමතන්න - 071 777 4440/0756999990/071 8540371







































LOL.lk
online Book Store

071 777 4440/0756999990/071 8540371


## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්




## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්




## කෙටි සටහන් පොත්




මිටිටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

ප්‍රශ්නපත්‍ර පොත්
ගෙදරටම ගෙන්ව ගන්න
ඔන්ලයින් ඔඩර් කරන්න
WWW.LOL.LK
වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal
NO PAYPAL ACCOUNT NEEDED!

ONLINE
BOOK STORE

An evening of fun for young readers

